# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

## ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (මධ්‍යම පළාත) සභාපති විසින්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. කොන්ත්‍රාත්තුවේ විස්තර

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | කොන්ත්‍රාත්තුවේ නම | වැඩ විස්තරය | ඉංජිනේරු ඇස්තමේන්තුව (අවිනිශ්චිත වියදම් හා 20 % ලාබාංශ රහිතව) (රුපියල් මිලියන | ලංසු ආරක්ෂණය (රුපියල් | CIDA ශ්‍රේණිය | කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර දින) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | RDA/SP/1500KM/ CP/01 | පස්බාගේ කොරලේ | වරකාව ගම්මැද්ද මාර්ගය (0+000 – 1+420) කි.මී. දක්වා වැඩිදියුණු කිරීම. | කාපට් | 20.1 | 300,600.00 | C5,C6 | 90 |
| 02 | RDA/SP/1500KM/ CP/03 | හතරලියද්ද | පීක්වත්ත මාර්ගය (0+000 – 1+100) කි.මී. දක්වා වැඩිදියුණු කිරීම. | කාපට් | 12.9 | 192,800.00 | C5,C6 | 90 |
| 03 | RDA/SP/1500KM/ CP/04 | හගුරන්කෙත | ඇකිරිය හපුගස්දෙනිය කොස්ගහදෙබල මාර්ගය (1+036-2+610) කි.මී. දක්වා වැඩිදියුණු කිරීම. | කාපට් | 23.2 | 346,700.00 | C5,C6 | 90 |
| 04 | RDA/SP/1500KM/ CP/07 | විල්ගමුව | සෝනුත්ත 6 ඇළ මාර්ගය (0+200-1+360) කි.මී. දක්වා වැඩිදියුණු කිරීම. | අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් | 18.2 | 272,100.00 | C5,C6 | 90 |
| 05 | RDA/SP/1500KM/ CP/08 | දඹුල්ල | ගිමන්හල මාර්ගය (0+000-2+065) කි.මී. දක්වා වැඩිදියුණු කිරීම. | කාපට් | 23.0 | 344,200.00 | C5,C6 | 90 |
| 06 | RDA/SP/1500KM/ CP/09 | දඹුල්ල | සීගිරිය 4 කණුවේ සිට තල්කොටේ මාර්ගය (0+000 – 1+300) කි.මී. දක්වා වැඩිදියුණු කිරීම. | කාපට් | 23.0 | 344,200.00 | C5,C6 | 90 |

03. මෙම ප්‍රසම්පාදනය ජාතික තරඟකාරී ලංසු තැබීම (NCB) හරහා සිදු කෙරේ. මෙම ප්‍රසම්පාදනය යටතේ (වැට් බදු සහ අනෙකුත් බදු හැර) සිදුකිරීමට නියමිත වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මි. 50 ට අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛණයේ අංක 04/2026 (iii) හි කලාපීය මනාපය සහ CIDA ශ්‍රේණියේ මනාපය සලකනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් මහා මාර්ග විශේෂත්වය යටතේ ඉහත වගුවේ දක්වා ඇති පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අදාළ ශ්‍රේණියේ ලියාපදිංචි වී සිටිය යුතුය.

05. මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.02.21** දින සිට පහත සඳහන් කාර්යාල වලින් ලංසු ලේඛණ පරික්ෂා කිරීම සිදු කළ හැකි අතර **2024.02.21** වන දින සිට **2024.03.12** දක්වා 9.00 පැය සිට 15.00 පැය අතර කාලයේදී පහත සඳහන් කාර්යාල වලින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

- ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැඳුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල
  දු.ක. අංකය - 011-2884790 ෆැක්ස් - 011- 2884790 විද්‍යුත් තැපැල් - procurement@rda.gov.lk

- පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය(ම.ප), මාර්ග සංවර්ධන අධිකාරිය, අස්ගිරිය,. මහනුවර.
  දු.ක. අංකය - 0812-226150 ෆැක්ස් - 0812-237931 විද්‍යුත් තැපැල් - pdcentral123@gmail.com
  0812-232119

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. අස්ගිරිය. මහනුවර
  දු.ක.අංකය - 0812-222005 ෆැක්ස් - 0812-222005 විද්‍යුත් තැපැල් - cekandyrda@gmail.com

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. මාතලේ
  දු.ක.අංකය - 066-2222009 ෆැක්ස් - 066-2222009 විද්‍යුත් තැපැල් - cematalerda3270@gmail.com

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, නුවරඑළිය
  දු.ක.අංකය - 0522-222552 ෆැක්ස් - 0522-222553 විද්‍යුත් තැපැල් - nuwaraeliyace@gmail.com

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් මහනුවර අස්ගිරියෙහි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලයෙන් සහ ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැඳුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල කාර්යාලයෙන් ලංසු ලේඛණ කාර්යාලීය වේලාව තුලදී කිසිදු ගාස්තුවකින් තොරව පරීක්ෂා කිරීම කල හැකි අතර **2024.02.21** දින සිට **2024.03.12** දින දක්වා 9.00 පැය සිට 15.00 පැය කාලය තුල ආපසු නොගෙවනු ලබන රු. **4,130.00** ලේඛණ ගාස්තු ගෙවීම් කරන ලද (බදු සහිතව) රිසිට්පතද සමඟ ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සම්පූර්ණ අයදුම්පත් කට්ටලයක් පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලය , මාර්ග සංවර්ධන අධිකාරිය හෝ ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, "මග නැගුම මහ මැඳුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල කාර්යාලය වෙතින් ලබා ගත හැකිය.

07. **2024.03.06** වන දින පෙ.ව. 10. 00 ට අදාල ප්‍රධාන ඉංජිනේරු (මහනුවර/මාතලේ/නුවරඑළිය) කාර්යාලයාල වලදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. අස්ගිරිය. මහනුවර
- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. මාර්ග සංවර්ධන අධිකාරිය. මාතලේ
- ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, නුවරඑළිය

08. ලංසුව. ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර **2024.06.13** දින දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය. ලංසු ආරක්ෂණයක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. 1987 අංක 3 දරන පොදු පනත අනුව මිලියන 5 ට වැඩි ලංසු සඳහා ලංසුකරුවන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සහතිකය සමඟ ලංසු ඉදිරිපත් කළ යුතුය.

10. සම්පූර්ණ කල ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුව සහ අංකය සඳහන් කර සභාපති. ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව. මාර්ග සංවර්ධන අධිකාරිය. තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර යන ලිපිනයට **2024.03.13** දින **14.00** පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදින **14.30** පැයට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති.**
**ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව(මධ්‍යම පළාත)**
**පළාත්භාර අධ්‍යක්ෂ(ම.ප) කාර්යාලය.**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**
**තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර.**